# පුද්ගලික දත්ත ආරක්ෂණ නිවේදනය

## පටුන


1. මූලික යෙදුම් (The Basic Terms).......... 3
2. අප විසින් ලබාගන්නා තොරතුරු වල ස්වාභාවය සහ ඒවා ලබාගන්නා අයුරු හා ලබාගැනීමට හේතුව (Types of information we collect, how and why).......... 3
3. ඔබගේ පුද්ගලික දත්ත අප විසින් සුරක්ෂිත කරන අයුරු (How we secure your personal data).......... 5
4. ඔබේ පුද්ගලික දත්ත අප විසින් ළඟ තබා ගන්නා කාලය (How long we keep your personal data).......... 5
5. ඔබගේ පුද්ගලික දත්ත හෙළිදරවු කිරීම (Disclosing your personal data).......... 6
6. ශ්‍රී ලංකාවෙන් පිටතට ඔබේ දත්ත පැවරීම (Transferring your personal data out of Sri Lanka).......... 7
7. ස්වයංක්‍රීය, තීරණ-ගැනීමේ පද්ධති භාවිතය (Use of Automated Decisions Making Systems).......... 7
8. ඔබේ අයිතිවාසිකම් (Your rights).......... 7
9. අප සමග සම්බන්ධ වන්න (Get in touch with us).......... 9

කාර්ගිල්ස් බැන්ක් පීඑල්සී, දත්ත පාලකයකු වශයෙන් 2022 අංක 9 දරන පුද්ගලික දත්ත ආරක්ෂණ පනත (PDPA) යටතේ ඔබගේ පුද්ගලික දත්ත හසුරුවන අයුරු මෙම දත්ත ආරක්ෂණ නිවේදනය මගින් පැහැදිලි කෙරෙයි. අප විසින් ලබාගන්නා තොරතුරු මොනවාද, අප විසින් ඒවා භාවිත කරන අයුරු හා ඒ මන්ද, අප ඒවා බෙදා-හදා ගන්නේ කා සමගින්ද, සහ අප ඒවා සුරකිව තබාගන්නේ කෙසේද යන කරුණු එමගින් ආවරණය කෙරෙයි. අපගේ සැලසුම් හා සේවාවන් පිළිබඳව විමසන, ඒවා භාවිත කරනු ලබන හෝ ඒවා භාවිත කර ඇති සහ කාලාන්තරයන් හි දී ඒ පිළිබඳව යාවත්කාලීන කරනු ලබන ඕනෑම කෙනෙකු වෙත මෙම නිවේදනය අදාළ වේ.

## 1. මූලික යෙදුම් (The Basic Terms)

මෙම නිවේදනය මගින් "අපි", "අප", "අපේ", යනුවෙන් භාවිත කරන විට ඉන් හැඳින්වෙන්නේ PDPA යටතේ දත්ත පාලකයා වශයෙන් ඔබේ පුද්ගලික දත්ත පිළිබඳ සැකසුම් කටයුතු සිදු කරන්නේ කෙසේද සහ මන්ද යන වග තීරණය කිරීමේ වගකීම දරන කාර්ගිල්ස් බැන්ක් පීඑල්සී වේ.

"ඔබ", හෝ "ඔබේ" යන්නෙන් අදහස් වන්නේ, විය හැකි, වත්මන්, හෝ පෙර සිටි ගනුදෙනුකරුවකු, බලයලත් නියෝජිතයකු, හෝ අපගේ වෙබ්අඩවිය හෝ සමාජ මාධ්‍ය පිටු වෙත පිවිසෙන අයෙකු වේ. ඔබගේ පුද්ගලික දත්ත මීට සම්බන්ධ නම්, "දත්ත විෂයයක්" වශයෙන් මෙම නිවේදනය ඔබට අදාළ වේ; කෙසේ වෙතත්, සමාගම් පිළිබඳ දත්ත සහ නිර්නාමික කරන ලද වැනි පුද්ගලික-නොවන හෝ මනුෂ්‍යයකු හඳුනා ගැනීමක් කළ නොහැකි දත්ත සම්බන්ධයෙන් මෙය අදාළ නොවේ.

අපගේ "සැලසුම් හා සේවාවන්" වලට කාර්ගිල්ස් බැන්ක් පීඑල්සී විසින් පිරිනමනු ලබන ගිණුම්, ණය පහසුකම්, කාඩ්පත්, සහ ඒ හා සමාන දෑ ඇතුළත් වේ.

## 2. අප විසින් ලබාගන්නා තොරතුරු වල ස්වාභාවය සහ ඒවා ලබාගන්නා අයුරු හා ලබාගැනීමට හේතුව (Types of information we collect, how and why)

ඔබගේ මූල්‍ය අවශ්‍යතාවන්ට හා අපගේ ව්‍යාපාරික අවශ්‍යතාවන්ට අදාළ හා අනිවාර්ය වන පුද්ගලික දත්ත සෑම අවස්ථාවකම අප විසින් ලබා ගන්නේ අදාළ නීති වලට අනුව වේ. සෘජුවම ඔබ වෙතින් (උදා: අයදුම්පත්, සමීක්ෂණ, ශාඛා වෙත පැමිණීම්), ඔබ විසින් අපගේ සැලසුම් සහ සේවාවන් භාවිත කිරීම හරහා උත්පාදනය කිරීමෙන්, සහ සේවාදායකයන්, මූල්‍ය ආයතන, ණය වාර්තාකරණ නියෝජිතායතන, පොදු මාර්ග, සහ සමාජ මාධ්‍ය වැනි තෙවැනි පාර්ශ්වයන් වෙතින් ලබාගැනීමෙන්, අප විසින් පුද්ගලික දත්ත ලබාගැනීම කළ හැකි වේ.

ඔබේ අවශ්‍යතාවන්ට සරිලන සේ සැකසූ සහ සුරක්ෂිත කළ මූල්‍ය සේවාවන් ඔබ වෙත සැපයීම සම්බන්ධයෙන් අත්‍යවශ්‍ය වන පුළුල් පරාසයකින් යුතු තොරතුරු, අප විසින් සකසනු ලබන මෙකී පුද්ගලික දත්ත මගින් ආවරණය කෙරෙයි. එම තොරතුරු වලට පහත දෑ ඇතුළත් වේ:

- අනන්‍යතාව සහ සම්බන්ධවීමේ තොරතුරු: ඔබගේ සම්පූර්ණ නම, උපන් දිනය සහ ස්ථානය, ජාතිකත්වය, අනන්‍යතා අංක (ජාතික හැඳුනුම්පත්, විදේශ ගමන් බලපත්‍ර, හෝ රියදුරු බලපත්‍ර වැනි),

පදිංචි සහ ලිපි ගනුදෙනු කිරීමේ ලිපිනයන්, දුරකථන අංක සහ ජංගම දුරකථන අංක, සහ ඊමේල් ලිපිනයන් වැනි තොරතුරු මීට ඇතුළත් වේ. ඔබගේ අනන්‍යතාව තහවුරු කරගැනීමටත්, ඵලදායී ලෙස ඔබ සමග සන්නිවේදනයේ යෙදීමටත්, සහ නියාමන හා නෛතික අවශ්‍යතාවන්ට අනුකූල වීමටත් මෙම තොරතුරු අපට උපකාරී වේ.

- මූල්‍යමය දත්ත: ඔබේ ගිණුම් අංක, ක්‍රෙඩිට් සහ ඩෙබිට් කාඩ්පත් අංක, ගනුදෙනු වාර්තා, ගිණුම් ශේෂයන්, ගෙවීම් පිළිබඳ පසුගිය විස්තර, ණයවර සීමාවන්, ණයවර අගයයන්, ණයවර අවදානම් තක්සේරු ද මීට ඇතුළත් වේ. ඔබගේ රැකියා තත්ත්වය, ආදායම් මාර්ග, සහ වත්කම් හෝ බැරකම් පිළිබඳ තොරතුරු ද අප විසින් ලබාගත හැකි වන අතර, ඒ සියල්ලම සැලසුම් සහ සේවාවන් සඳහා ඔබගේ යෝග්‍යතාව තක්සේරු කිරීමේ දී හා අප සමග වන ඔබගේ මූල්‍ය සබඳතාව කළමනාකරණය කිරීමේදී මෙන්ම  නියාමන හා නෛතික අවශ්‍යතාවන්ට අනුකූල වීමේ දී අපට ඉතා වැදගත් වේ.
- භාවිත කිරීම් හා මනාපයන්:  සැලසුම් හා සේවාවන් සම්බන්ධයෙන් ඔබගේ කැමැත්ත පිළිබඳ තොරතුරු, ගිණුම් භාවිත කිරීමේ කාලාන්තරයන් හා රටාවන්, සන්නිවේදන සහ අලෙවිකරණ තේරීම්, මෙන්ම සමීක්ෂණ සහ අපගේ කාර්ය මණ්ඩලය සමග කටයුතු කිරීම් හරහා සපයනු ලබන ප්‍රතිචාර ආදී තොරතුරු.  උපාංග වර්ග, මෙහෙයුම් පද්ධති බ්‍රවුසර් තොරතුරු, ඇතුළුව අපගේ ඩිජිටල් වේදිකා ඔබ විසින් භාවිත කිරීම පිළිබඳ තොරතුරු සහ අපගේ වෙබ්අඩවිය, යෙදුම්, හෝ වෙනත් ඔන්ලයින් සේවාවන් සමග ඔබගේ සම්බන්ධවීම පිළිබඳ තොරතුරු ද අප විසින් එකතු කරනු ඇත.
- අනුකූලතාව සහ ආරක්ෂාව පිළිබඳ දත්ත: නිසි උද්යෝගය, මුදල් විශුද්ධිකරණය, සහ වංචා වැළැක්වීම සම්බන්ධයෙන් අවශ්‍ය කෙරෙන ලේඛන සත්‍යාපනය කිරීමේ, සන්නිවේදනය පිළිබඳ වාර්තා, සැකකටයුතු ගනුදෙනු පිළිබඳ ඇඟවීමේ සංඥා, සහ විගණන තොරතුරු වැනි වාර්තා මෙමගින් ආවරණය වේ.  පද්ධතියේ ආරක්ෂාව අධීක්ෂණය කිරීමට, ඔබේ ඔන්ලයින් අනන්‍යතාව සත්‍යාපනය කිරීමට, සහ අසාමාන්‍ය හෝ අවසර නොලත් ක්‍රියාකාරකම් දැන-සොයා ගැනීමට අප විසින් කුකීස්, විශ්ලේෂණය කිරීම සඳහා මෙවලම්, සහ ඒ හා සමාන තාක්ෂණයන් අප විසින් භාවිත කරනු හැකි අතර, එමගින් අප හට  නෛතික හා නියාමන අවශ්‍යතාවන්ට ප්‍රතිචාර දැක්වීමේ හැකියාව ද ලැබේ.

පෝරම, අයදුම්පත් සම්පූර්ණ කිරීම, විමසීම් සිදු කිරීමට, හෝ ශාඛාවන් වෙත යාම් වැනි ඍජු අන්‍යෝන්‍ය ක්‍රියාකාරකම් වලට අමතරව, අපගේ වෙබ්අඩවිය, ජංගම යෙදුම්, ඔන්ලයින් බැංකුකරණය, සහ පාරිභෝගික සහය සඳහා වන ක්ෂණික ඇමතුම් අංක ද ඇතුළුව ඩිජිටල් ආකාරයන් හරහා ද අප විසින් තොරතුරු ලබාගනු හැකිය.  මෙකී මාර්ගගතයන් විසින් කුකීස්, ට්‍රැකිංග් පික්සල්ස්, සහ ආරක්ෂිතව පිවිසීම් වැනි තාක්ෂණයන් භාවිත කරනු ඇත්තේ ඔබගේ දත්ත ආරක්ෂා කිරීමට, ඔබට පුද්ගලාරෝපිත අත්දැකීම් ලබාදීමට, සහ අපගේ සේවාවන් හි පරිපූර්ණ භාවය සහතික කිරීමටත් ය.

එසේම, සේවාදායකයන්, වෙනත් මූල්‍ය ආයතන, ණය වාර්තාකරණ නියෝජිතායතන, පොදුවේ පිවිසිය හැකි මාර්ග, සහ සමාජ මාධ්‍ය වැනි තෙවැනි පාර්ශ්වයන් වෙතින්ද අදාළ තොරතුරු අප වෙත ලැබේ. ලබාගැනීමෙන්, අප විසින් පුද්ගලික දත්ත ලබාගැනීම කළ හැකි වේ.  ඔබේ දත්ත වල නිවැරදි භාවය සත්‍යාපනය කිරීමට, යෝග්‍යතාව තක්සේරු කිරීමට, නෛතික වගකීම් ඉටු කිරීමට, සහ අපගේ සේවාවන් හි සමස්ත ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීමට එය අපට උපකාරී වනු ඇත.

ඔබගේ පුද්ගලිකත්වය සහ ආරක්ෂාව අපට අතිශයින්ම වැදගත් වේ. සියලුම පුද්ගලික දත්ත හසුරුවනු ලබන්නේ PDPA වෙත සහ අපගේ අභ්‍යන්තර ප්‍රතිපත්ති වලට අනුකූලව වේ. එමගින් රහස්‍ය භාවය, අවංකකම, සහ සෑම අවස්ථාවකදීම ඔබේ තොරතුරු නීත්‍යානුකූලව යොදා ගැනීම ආදී කරුණු සහතික කෙරෙයි. එසේ හෙයින්, පහත දක්වා ඇති කරුණු අතරින් එකක් හෝ අදාළ නොවේ නම්, අප විසින් ඔබගේ පුද්ගලික දත්ත සම්බන්ධයෙන් සැකසුම් කටයුතු සිදු නොකරනු ඇත:

- ඔබේ ඉල්ලීම මත ගනු ලබන යම් පූර්ව-ගිවිසුම්ගත පියවර (උදාහරණ: නිවාස ණයක් සම්බන්ධයෙන් ඔබ විසින් අප විමසන විටදී ඔබ පිළිබඳ ණයවර පිරික්සුමක් අප විසින් සිදු කරන විට) ද ඇතුළත්ව, ඔබ සමග ගිවිසුමකට ඇතුළත් වීමට.
- නීතිය මගින් අප වෙත පනවා ඇති නෛතික වගකීමකට (උදාහරණ: 2006 අංක 6 දරන මූල්‍ය ගනුදෙනු වාර්තාකරණ පනත යටතේ වන අවශ්‍යතාවන්ට අනුකූලව, යම් සැකකටයුතු මුදල් විශුද්ධිකරණයක් සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ ක්‍රියාකාරකමක් පිළිබඳව මූල්‍ය බුද්ධි ඒකකය වෙත දැනුම්දීම සම්බන්ධයෙන් අනුකූල වීමට).
- ඔබේ කැමැත්ත සමගින් (උදාහරණ: SMS හරහා අප විසින් ඔබ වෙත පුද්ගලාරෝපිත සැලසුම් පිරිනැමීම් ප්‍රවර්ධනය කිරීම සඳහා ඔබේ කැමැත්ත ඉල්ලන විට)
- අපගේ නීත්‍යානුකූල ලැදියාවන් සඳහා (උදාහරණ: වංචා අනාවරණය කරගැනීම පිණිස අප විසින් ගනුදෙනු අධීක්ෂණය කරන විට).
- පොදු යහපත උදෙසා අප විසින් යම් කාර්යභාරයක් ඉටු කරන විට.

## 3. ඔබගේ පුද්ගලික දත්ත අප විසින් සුරක්ෂිත කරන අයුරු (How we secure your personal data)

අප විසින් ලබාගන්නා, ගබඩා කරන, සම්ප්‍රේෂණය කරන සහ බැහැර කරන පුද්ගලික දත්ත වල රහස්‍ය භාවය, සම්පූර්ණත්වය සහ ලබාගැනීමේ හැකියාව සහතික කිරීමෙහි ලා අප විසින් කර්මාන්තය විසින් පිළිගත් තාක්ෂණය, ආරක්ෂාව පිළිබඳ කාර්යපිළිවෙත් සහ පරිචයන් යොදාගනු ලැබේ. පුද්ගලික දත්ත අවභාවිතයෙන්, නැතිවීමෙන් සහ ඒවා වෙත අනවසර ප්‍රවේශයෙන්, වෙනස් කිරීමෙන් හෝ හෙළිදරව් කිරීමෙන් ආරක්ෂා කෙරෙන බව සහතික කිරීම පිණිස අප විසින් ගැළපෙන තාක්ෂණික සහ ආයතනික පියවර යොදා ගනු ලැබේ.

## 4. ඔබේ පුද්ගලික දත්ත අප විසින් ළඟ තබා ගන්නා කාලය (How long we keep your personal data)

ඔබේ පුද්ගලික දත්ත රඳවා තබාගන්නා කාලය තීරණය කරන විට, අප විසින් අදාළ නියාමන කාර්යරාමු, නෛතික අවශ්‍යතා සහ බැංකුවෙහි මෙහෙයුම් අවශ්‍යතා ආදිය සැලකිල්ලට ගනු ලබයි.

ඔබගේ අනන්‍යතා දත්ත සහ මූල්‍ය දත්ත ඇතුළත්ව නමුත් ඊට සීමා නොවී, ඔබට අදාළ සියලුම පාරිභෝගික දත්ත අප විසින් රඳවා තබා ගනු ලබයි. ගනුදෙනුකරුවකු ලෙස අප සමග කටයුතු කිරීම ඔබ විසින් අවසන් කළ අවස්ථාවේ සිට වසර හත (07) ක කාලසීමාවක් සඳහා එසේ පාරිභෝගික දත්ත රඳවා ගැනීම අපගේ අභ්‍යන්තර ප්‍රතිපත්ති වලට අනුව අවශ්‍ය කෙරෙයි.

කෙසේ වෙතත්, සන්නිවේදන වාර්තා, සංවාද පිළිබඳ පෙර-විස්තර සහ අන්තර්ජාල කුකීස් සම්බන්ධයෙන් වනවිට, මාස 6ක් වැනි හෝ ඊට අඩු, කෙටි රඳවා ගැනීමේ කාලසීමාවක් අප විසින් යොදා ගනු හැකිය.

කෙසේ වෙතත්, පහත සඳහන් අවස්ථාවන් හි දී වසර 7ක ට වැඩි දීර්ඝ කාලසීමාවක් සඳහා ඔබගේ දත්ත අප විසින් තබා ගනු ඇත:

- පවත්නා මතභේද හෝ නඩු කටයුතු වලට ප්‍රතිචාර දැක්වීමට.
- නීතිමය වශයෙන් නියම කිරීමේ කාලසීමාවන් තුළ පවත්නේ නම්, නෛතික සහ නියාමන ඉල්ලීම් වලට ප්‍රතිචාර දැක්වීමට.
- පර්යේෂණ හෝ සංඛ්‍යානමය කාර්යයන් උදෙසා.

පුද්ගලික දත්ත ලබා ගැනීමේ සහ ඒ පිළිබඳ සැකසුම් කටයුතු කිරීමේ අරමුණු අවසන් වූ විට, එවැනි පුද්ගලික දත්ත ආරක්ෂිතව විනාශ කිරීමට හෝ හඳුනා ගැනීමට නොහැකි තත්ත්වයට ස්ථිර වශයෙන් පත් කිරීමට හෝ නිර්නාමික කිරීමට අවශ්‍ය ප්‍රමාණවත් පියවර අප විසින් ගනු ඇත.

## 5. ඔබගේ පුද්ගලික දත්ත හෙළිදරවු කිරීම (Disclosing your personal data)

අප විසින් ඔබගේ දත්ත රහස්‍ය භාවය සුරකෙන අයුරින් තබා ගනු ලබන අතර, පහතින් දක්වා ඇති නිශ්චිත අවස්ථාවන් හි දී තෙවැනි පාර්ශ්වයන් සමගින් බෙදා-හදා ගැනීම අවශ්‍ය විය හැකියි:

- ශ්‍රී ලංකාව තුළ සහ ඉන් පිටත යන දෙවර්ගයේම බාහිර සේවා සපයන්නන් (සැකසුම් කටයුතු, අලෙවිකරණ කටයුතු, බෙදා හැරීම්, පර්යේෂණ, ණය එකතු කිරීම් ආදී);
- නීතිය මගින් නියම කර ඇති පරිදි විගණන හා අනුකූලතා අවශ්‍යතාවන් උදෙසා ශ්‍රී ලංකා මහ බැංකුව වැනි නියාමන දේහයන්;
- නීත්‍යානුකූල නොවන ක්‍රියාකාරකම් සිදුවන බවට සැක කරනු ලැබුවහොත්, නීතිය බලාත්මක කරන බලාධිකාරීන් සහ නියාමන ආයතන;
- අධිකරණ නියෝගයන්ට අනුව, ඔබගේ දත්ත අධිකරණ;
- ආයතනිකව-නිකුත් කරන ලද ක්‍රෙඩිට් කාඩ්පත් සම්බන්ධයෙන් වනවිට ඔබගේ සේවාදායකයා;
- සැලසුම් හා සේවාවන් ලබාදීම හෝ තොරතුරු සම්බන්ධයෙන් කාර්ගිල්ස් සමූහයේ ආශ්‍රිත සමාගම්;
- ණය තොරතුරු කාර්යාංශය වැනි ණය වාර්තාකරණ නියෝජිතායතන;
- ඔබගේ ඉල්ලීම මත නිශ්චිත සේවාවන් උදෙසා බාහිරව යොදා ගනු ලබන පුද්ගලයන් (උදා: විදේශ විනිමය, කළමනාකරණය කරනු ලබන අරමුදල්);
- ඔබේ පුද්ගලික දත්ත වෙත ප්‍රවේශය සඳහා ඔබ විසින් ලිඛිතව බලය ලබාදෙන වෙනත් ඕනෑම අයෙකු.

## 6. ශ්‍රී ලංකාවෙන් පිටතට ඔබේ දත්ත පැවරීම (Transferring your personal data out of Sri Lanka)

විවිධ වූ මෙහෙයුම් සහ/හෝ නෛතික අවශ්‍යතාවන් හේතුවෙන් ඔබේ පුද්ගලික දත්ත ශ්‍රී ලංකාවෙන් පිටතට පැවරීම හෝ ගබඩා කිරීම හෝ සිදු කළ හැකිය. PDPA යටතේ ලබාදෙන මට්ටමේ ආරක්ෂාව හා සමාන ආරක්ෂාවක් නොතිබිය හැකි රටවල පවා ඔබේ පුද්ගලික දත්ත ගබඩා කිරීම ද මීට ඇතුළත් විය හැකියි. එබැවින්, පුද්ගලික දත්ත ශ්‍රී ලංකාවෙන් පිටතට පැවරීම අප විසින් කළ යුතු වනවිට, PDPA යටතේ සහ අනෙකුත් අදාළ නීති යටතේ අදාළ නෛතික අවශ්‍යතාවන්ට අනුකූලව එවැනි පැවරීම් සිදු කිරීමට සහ එහිදී ප්‍රමාණවත් මට්ටමේ ආරක්ෂාවක් සහතික කිරීමට අප වග බලා ගනිමු.

## 7. ස්වයංක්‍රීය, තීරණ-ගැනීමේ පද්ධති භාවිතය (Use of Automated Decisions Making Systems)

අප සමග ඔබ හට සබඳතාවක් පිරිනමන විට සහ/හෝ පවතින සබඳතාව කළමනාකරණය කරන විට, අපගේ මෙහෙයුම් කාර්යරාමුව තුළ අප විසින් ස්වයංක්‍රීය, තීරණ-ගැනීමේ පද්ධති ක්‍රියාවට නැංවීම සිදු කළ හැකිය. ස්වයංක්‍රීය, තීරණ-ගැනීම් යනුවෙන් හැඳින්වෙන්නේ, මානව සම්බන්ධතාවකින් තොර වූ ස්වයංක්‍රීය යාන්ත්‍රණයක් හරහා පමණක් ගනු ලබන තීරණ හෝ විස්තර විශ්ලේෂණය කිරීම් වේ. මෙකී පද්ධති සාමාන්‍යයෙන් යොදා ගනු ලබන්නේ මානව තීරණ-ගැනීම් සම්බන්ධයෙන් වන සැකසුම් කටයුතු වලට සහය සැලසීමට ය. එහිදි සිදු කරනුයේ අප විසින් ස්ථාපිත කරනු ලබන නිශ්චිත නිර්ණායකයන්ට අනුව දත්ත විශ්ලේෂණය කිරීම වේ. අපගේ සැලසුම් හා සේවාවන් ඔබ විසින් භාවිත කිරීම උදෙසා හෝ භාවිත කරන විට හෝ ඒ සම්බන්ධයෙන් ඔබගේ යෝග්‍යතාව, අවදානම් සහ මනාපයන් තක්සේරු කිරීමේ දී අප විසින් මෙම පද්ධති යොදා ගනු හැකිය.

## 8. ඔබේ අයිතිවාසිකම් (Your rights)

PDPA යටතේ ඔබට පහත අයිතිවාසිකම් හිමි ය. එම අයිතීන්ගෙන් ඕනෑම අයිතියක් ක්‍රියාත්මක කිරීමට ඔබ අදහස් කරන්නේ නම්, කරුණාකර අප සමග සම්බන්ධ වන්න.

| අයිතිය | විස්තරය |
|---|---|
| **ප්‍රවේශය** | ඔබ පිළිබඳ ඕනෑම තොරතුරක සැකසුම් කටයුතු අප විසින් සිදු කරන බව තහවුරු කරගැනීමේ අයිතිය ඔබ සතුය. අප විසින් එසේ කරන්නේ නම්, අප සතුව පවතින ඔබේ පුද්ගලික දත්ත වෙත පිවිසීමට ඉල්ලා සිටීමට ඔබට හැකිය. මෙම නිවේදනය මගින් දක්වා ඇති ඕනෑම කාරණයක් සම්බන්ධයෙන් වන අතිරේක විස්තර ඉල්ලා සිටීමේ හැකියාවද ඔබට ඇත. |
| **විරෝධතාව** | අප විසින් ඔබේ දත්ත සම්බන්ධයෙන් සැකසුම් කටයුතු සිදු කර ඇත්තේ අපගේ නීත්‍යානුකූල ලැදියාවන් හෝ පොදු ලැදියාවන් අරමුණු කරගෙන බවට ඔබ විශ්වාස කරන්නේ නම්, එවැනි අරමුණු උදෙසා ඔබේ පුද්ගලික දත්ත සම්බන්ධයෙන් සැකසුම් කටයුතු කරන්නේ කෙසේදැයි ඔබට විරෝධතාවක් ඉදිරිපත් කිරීමේ හැකියාව පවතියි. |

| | |
|---|---|
| **කැමැත්ත ඉල්ලා අස්කර ගැනීම** | කිසියම් නිශ්චිත අරමුණක් උදෙසා ඔබේ පුද්ගලික දත්ත සම්බන්ධයෙන් සැකසුම් කටයුතු කිරීමට අප විසින් ඔබගේ කැමැත්ත ලබාගත්තේ නම්, එම කැමැත්ත ඕනෑම අවස්ථාවක ඉල්ලා අස්කර ගැනීමේ අයිතිය ඔබ සතුය. ඔබ විසින් එසේ ඉල්ලා අස්කර ගැනීමට පෙර අප විසින් සිදු කරන ලද සැකසුම් ක්‍රියාකාරකම් වලට එකී ඉල්ලා අස්කර ගැනීම බලපානු නොමැති බව කරුණාවෙන් සලකන්න. |
| **නිවැරදි කිරීම** | පුද්ගලික දත්ත කිසිවක් හෝ සාවද්‍ය නම් ඒවා නිවැරදි කරන ලෙසට ඔබට ඉල්ලා සිටියහැකි අතර, අසම්පූර්ණ දත්ත සම්පූර්ණ කරන ලෙසට ද ඔබට ඉල්ලා සිටිය හැකියි. |
| **මකා දැමීම** | අප විසින් ඔබගේ දත්ත සම්බන්ධයෙන් සැකසුම් කටයුතු සිදු කරන්නේ PDPA උල්ලංඝනය වන අයුරින් බවට ඔබ විශ්වාස කරන්නේ නම්, හෝ ඔබේ කැමැත්ත ඔබ විසින් ඉල්ලා අස්කර ගෙන ඇත්නම් හෝ, ඔබගේ පුද්ගලික දත්ත අප විසින් මකා දැමිය යුතු බවට ඔබට ඉල්ලා සිටිය හැකියි. අධිකරණ නියෝගයක් මගින් අවශ්‍ය කෙරෙන්නේ නම් ද, අදාළ නීති වලට අනුව අප විසින් ඔබේ දත්ත මකා දැමීම සිදු කරනු හැකිය. |
| **ස්වයංක්‍රීය, තනි පුද්ගල තීරණ-ගැනීම්** | ඔබ පිළිබඳ කිසියම් තීරණයකට එළඹ ඇත්තේ මානව සම්බන්ධ වීමකින් තොරව, සම්පූර්ණයෙන්ම ස්වයංක්‍රීය මාර්ගයක් මගින් නම්, සහ එමගින් සැලකිය යුතු හෝ දිගු කාලීන හෝ බලපෑමක් ඔබගේ අයිතිවාසිකම් වලට හෝ නිදහසට හෝ ඇති වේ නම්, එකී තීරණය සමාලෝචනය කරන ලෙසට ඔබට ඉල්ලා සිටිය හැකිය. |
| **නිදහස් කිරීම්** | PDPA යටතේ, නිශ්චිත හේතු මත පදනම්ව ඔබගේ ඉල්ලීම අප විසින් නීත්‍යානුකූලව ප්‍රතික්ෂේප කළ හැකි අතර, ජාතික ආරක්ෂාව, මහජන සාමය, සක්‍රීය නීතිමය ක්‍රියාමාර්ග, අපරාධ වැළැක්වීම හෝ නඩු පැවරීම, අන් අයගේ අයිතිවාසිකම් හෝ නිදහස, තාක්ෂණික හෝ මෙහෙයුම් ශක්‍යතාව, ඔබේ අනන්‍යතාව තහවුරු කිරීමට නොහැකි වීම, හෝ ඔබගේ දත්ත සම්බන්ධයෙන් අප විසින් සැකසුම් කටයුතු සිදුකිරීමේ දී අවශ්‍ය වන නෛතික බැඳීම් ආදී කරුණු ආශ්‍රිත හේතු ද ඊට ඇතුළත් වේ. |
| **දත්ත ආරක්ෂණ අධිකාරිය වෙත අභියාචනා කිරීම** | එවැනි ඕනෑම ඉල්ලීමකට අප විසින් දක්වන ලද ප්‍රතිචාරය සම්බන්ධයෙන් ඔබ සෑහීමකට පත් නොවේ නම්, ශ්‍රී ලංකා දත්ත ආරක්ෂණ අධිකාරිය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමේ අයිතිය ඔබ සතු වේ. අභියාචනයක් ඉදිරිපත් කිරීම සම්බන්ධ වැඩි විස්තර සඳහා කරුණාකර ඔවුන්ගේ නිල වෙබ් අඩවිය: www.dpa.gov.lk වෙත පිවිසෙන්න. |

## 9. අප සමග සම්බන්ධ වන්න (Get in touch with us)

ඔබට වැඩි විස්තර කිසිවක් අවශ්‍ය නම් හෝ, ඔබේ අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමට ඔබ අදහස් කරන්නේ නම් හෝ, අප සමග සම්බන්ධ වන්න.

අපගේ ක්ෂණික ඇමතුම් අංකය අමතා : 0117640640

අපගේ ඕනෑම ශාඛාවක් වෙත පැමිණ : *https://www.cargillsbank.com/our-network/*

දත්ත ආරක්ෂණ නිලධාරියා හා සම්බන්ධව : කුසල කරුණාරත්න

ඊමේල් : Kusala.k@cargillsbank.com

තැපැල් : අංක 696, ගාලු පාර, කොළඹ 3.